# ශ්‍රී ලංකාවේ ආගම්වල නූතන සමාජ කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඩබ්ලිව්.ඒ. නදීෂා මධුෂානි රාජපක්ෂ*[1]

මිනිසා විසින් හඳුනාගත් අපූර්ව සංකල්පයක් ලෙස ආගම (Religion) හැඳින්විය හැකි ය. සමාජය විසින් නිර්මාණය කර ගැනුණු ආගම සෑම කල්හි ම සමාජ අපේක්ෂා වෙනුවෙන් පෙනී සිටියි. ආගම යන්නෙන් ශ්‍රී ලංකාවේ ආගම් ව්‍යවහාරයෙහි ලා ගැනෙන හින්දු, බෞද්ධ, කතෝලික, ඉස්ලාම් යන ආගම් අදහස් කෙරේ. මෙම සෑම ආගමක ම මූලික ඉගැන්වීම්වල යම් විෂමතාවක් පවතී. නිදසුන් ලෙස නිර්වාණය, දෙවියන් සමඟ එක් වීම ආදිය දැක්විය හැකි ය. එසේ මූලික ඉගැන්වීම්වල යම් විෂමතාවක් පැවතුණ ද පොදුවේ මෙම සෑම ආගමක් ම සමාජ කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ බවට පත්වන්නේ ශ්‍රී ලංකාවේ සෑම ආගමක් ම සතු ව පවතින නූතන සමාජ කාර්යභාරය පිළිබඳ අවධාරණය කරලීමයි. දේශපාලන, ආර්ථික, සමාජීය හා ආගමික යන ක්ෂේත්‍රයන්හි පවතින අභියෝග ජය ගැනීම සඳහා ආගම සතු වන නූතන සමාජ කාර්යභාරය කුමක් ද යන්න විමසීම මෙහි පර්යේෂණ ගැටලුවයි. මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් මූලාශ්‍රය අධ්‍යයනය මඟින් තොරතුරු ලබා ගනිමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත ශිල්ප අන්තර්ගත මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් භාවිත කෙරේ. සමාජය තුළ ඇති වන ආගමික හා වාර්ගික ගැටුම් ආදිය නිරාකරණය කර ආගමික සංහිඳියාව ඇති කරලීම ආගම සතු ප්‍රධාන කාර්යභාරයකි. මීට අමතර ව දේශපාලන ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන විවිධ අර්බුදකාරී තත්ත්වයන්ගෙන් මෙරට මුදවා ගැනීමට ද ආගම විසින් තම දායකත්වය සපයනු ලබයි. ආගමික ආයතන මඟින් සමාජ සුබ සාධනය, අධ්‍යාපනය, සෞඛ්‍යය සේවා හා මානුෂීය ප්‍රයත්නයන් සඳහා ක්‍රියාකාරී ව සම්බන්ධ වන්නේ ද ආගම සතු නූතන සමාජ කාර්යභාරය ප්‍රකට කරමිනි. ඒ අනුව ආගම විසින් සමාජීය අභියෝගවලට මුහුණ දීමේ දී හා ආන්තික ප්‍රජාවට සහාය දීම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙවැනි අභියෝගවලට සාර්ථක ව ප්‍රතිචාර දැක්වීම සඳහා ආගම විසින් ආගමික ප්‍රතිපත්තියට එහා ගිය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ යුතු අතර එය අවධාරණය කරලීම මෙම පර්යේෂණය මඟින් සිදු කෙරේ. සමස්තයක් ලෙස මෙම කරුණු දෙස අවධානය යොමු කළ විට ශ්‍රී ලංකාව තුළ පවතින විවිධ වාර්ගික ගැටුම්, දේශපාලන අර්බුද, ආර්ථික ගැටලු ආදි අභියෝග ජය ගැනීම සඳහා මෙන් ම සමාජ සුභසාධනය සඳහා ද ආගම විසින් ආගමික ප්‍රතිපත්තියට එහා ගිය බහුවිධ කාර්යභාරයක් ඉටු කරන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** අභියෝග, ආගම, නූතන, සමාජ කාර්යභාරය, ශ්‍රී ලංකාව

[1] කැලණිය විශ්වවිද්‍යාලය nadeeshar85@gmail.com